# ඓතිහාසික රාජධානියක් සහ බළකොටුවක් බවට පත්වීමට කෝට්ටේ සමත් වූයේ ප්‍රදේශයෙහි පැවති ස්වභාවික රැකවරණය හේතු කරගෙන ද ?

එස්- සී- ජයසිරිවර්ධන

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sankajayasiriwardana@gmail.com

---

දහහතර වන සියවස මැදභාගය තුළදී ගම්පොළ රාජධානියෙහි අගමැතිවරයා වූ ප්‍රභුරාජ අලකේශ්වරයන් විසින් කෝට්ටේ බළකොටුව බවට නිර්මාණය කරනු ලැබිණි. ක්‍රිස්තු වර්ෂ 1410 දී නව රාජ්‍ය පරපුරක් ආරම්භ කළ සයවන පාරාක්‍රමබාහු රජු තම රාජධානිය ලෙස තෝරාගන්නා ලද්දේ කෝට්ටේය. එතැන් සිට ක්‍රිස්තු වර්ෂ 1597 තෙක් ම ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන රාජධානිය වූයේ කෝට්ටේය. බළකොටුවක් බවට කෝට්ටේ සංවර්ධනය කිරීමට සහ රාජධානියක් ලෙස වර්ධනයවීම උදෙසා කෝට්ටේ ප්‍රදේයෙහි පැවති ස්වභාවික රැකවරණය සහ පිහිටීම ඉවහල් වී ද යන්න මත පිහිටා මෙම පර්යේෂය සිදුකරනු ලැබිණි.

කෝට්ටේ ප්‍රදේශය වටා තුන් පැත්තකින් ගලා යන දියවන්නා ඔය නිසා ප්‍රදේශය අර්ධද්වීපිකව ආරක්ෂිත ය. කෝට්ටේ ප්‍රදේශයට ද යාව පැතිර ඇති බටහිර තැනිතලාව නිසා සතුරු ආක්‍රමණයකදී සහ බලය ගොඩනැගීමට පිහිටීම වැදගත් විය. කෝට්ටේ ආශ්‍රිතව පැවති මඩගොහුරිත වගුරුබිම් නිසා කෝට්ටේට ප්‍රවේශ විය හැක්කේ එක් අන්තයකින් පමණකි. වගුරු බිම් හා කෝට්ටේ භූමිය අතර ප්‍රදේශයෙහි පවතින අඳුරු සහිත කඩොලාන වනාන්තර නිසා සතුරු ආක්‍රමණයකදී සාර්ථක ලෙස මුහුණ දීමට බළකොටුව තුළ වාසයකළ ජනතාවට හැකියාව ලැබෙන්නට ඇත. කෝට්ටේ ප්‍රදේශයට ප්‍රවේශ වියහැක්කේ ද දකුණු දෙසින් විහිදී ඇති වගුරුබිම් මතින් විහිදි පටු තීරුවක් තුළිනි. කෝට්ටේ ප්‍රදේශය පිහිටා ඇත්තේ උන්නතාංශික රැළි බිම් තීරුවකය. ප්‍රදේශය දෙපස සිට ක්‍රමයෙන් මධ්‍යය කෝට්ටේ ප්‍රදේශයයට උස් වන ලක්ෂණ සහිතය. ප්‍රදේශයෙහි මෙම පිහිටීම ආරක්ෂිතව වැදගත් වේ. කෝට්ටේට නුදුරුව උස් බිම් දැකිය හැකිය. එම උස්බිම් ආරක්ෂාව උදෙසා බැලුම්ගල් සහ මුර කපොලු ලෙස භාවිත කළ බවට සාධක ද සහිතය. එම උස්බිම් අතර බැද්දගාන, මාදිවෙල, පාගොඩ, බොරැල්ල, අංගොඩ ප්‍රධාන වේ. කෝට්ටේ වටා අර්ධ කවාකාරව විහිද යන දියවන්නාව තරණය කළ නොහැකි ගැඹුරකින් සහ මිනීමරු කිඹුලන් වාසය කරයි. වගුරුබිම් ආශිතව ද විෂ කටු පඳුරු පවතියි.

මෙහිදී මූලික නිගමනය වන්නේ කෝට්ටේ ප්‍රදේශය වට කොට දිය අගල් කැණ පවුරු බැඳ අලකේෂ්වරයන් ආරක්ෂිත බළකොටුවක් බවට පත් කරගන්නා ලද්දේ එහි පැවති ස්වභාවික ලක්ෂණ ද යොදා ගනිමිනි. සයවන පාරාක්‍රමබාහු රජු ප්‍රමුඛ පසුකාලීන පාලකයන් අගනුවර වශයෙන් කෝට්ටේ තෝරාගැනීමට හේතු වූයේ ද බළකොටුවක් ලෙස සංවර්ධනයව පැවතීම සහ ස්වභාවිකව පැවති රැකවරණය යන කරුණු පදනම් කරගෙනය.

මෙම උපන්‍යාසය සනාථ කිරීම සඳහා මෙයට සමාන ලක්ෂණ දරන රාජධානීන් ආදේශක වශයෙන් භාවිත කරනු ලැබිණි. ඒ අනුව සෙංකඩගල රාජධානිය විජාතිකයන් ඉදිරියෙහි ස්වාධීනව සහ බලවත්ව පැවතියේ ස්වභාවිකව පැවති රැකවරණය හේතුවෙනි. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල එසේ ස්වභාවික රැකවරණය මත ගොඩනැගුණු රාජධානි විය. එම රාජධානි හා සම තැන්හිම ස්වභාවික ආරක්ෂාව යන මුලධර්මය මත ආරම්භ වී වර්ධනය වූ රාජධානියක් ලෙස කෝට්ටේ රාජධානිය පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : කෝට්ටේ රාජධානිය, ස්වභාවික පිහිටිම, ස්වභාවික රැකවරණය